රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
Independence Square, Colombo 07, Sri Lanka


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MPA/PSD/PG.Con. | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.11.08 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් / උසස් කිරීම්වලට අදාළව සේවා ව්‍යවස්ථාවල සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීම - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය</u>**

සේවා ව්‍යවස්ථාවල සඳහන් පත්කිරීම් / උසස් කිරීම්වලදී සුදුසුකම් සනාථ කිරීම සඳහා නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික, අදාළ තනතුරේ පරිපාලන බලධාරීත්වය දරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එම සහතික නිකුත් කරන ලද ආයතනයෙන්ම සනාථ කර ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට එම කොමිෂන් සභාව තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/HB/26/2023 හා 2023.08.25 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

02. ඒ අනුව, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ උසස්වීම් කටයුතු සඳහා ඉදිරිපත් කළ යුතු, දැනට පශ්චාත් උපාධි අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති නිලධාරීන් තම පශ්චාත් උපාධි සහතික පත්‍ර හා ඒවායේ විස්තරාත්මක ප්‍රතිඵල සටහන්වල සහතික කළ පිටපත් එකී පශ්චාත් උපාධි ආයතන මඟින් සනාථ කර ගැනීම සඳහා **2023.12.15** දිනට පෙර පහත ලිපිනය වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර තවදුරටත් පශ්චාත් උපාධිය හදාරමින් සිටින නිලධාරීන් අදාළ අධ්‍යයන කටයුතු අවසන් වූ පසු එකී සහතිකපත්‍රවල සහතික කළ පිටපත් සනාථ කරගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව අවධාරණය කරමි.

අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන සේවා අංශය)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07


දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

03. තවද, මෙම පශ්චාත් උපාධි සනාථ කරගත් පමණින් එය සේවා ව්‍යවස්ථාවේ සඳහන් උසස්වීම් සඳහා සම්පූර්ණ කළ යුතු පශ්චාත් උපාධි විෂයය ක්ෂේත්‍රයන්ට අදාළ වන බව ඉන් අදහස් නොවේ. යම් නිලධාරියෙකු තමා විසින් සම්පූර්ණ කළ පශ්චාත් උපාධිය ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ “ඉ” පරිශිෂ්ඨයේ දක්වා ඇති විෂය ක්ෂේත්‍රයකට සෘජුව අදාළ නොවන්නේ නම් එහි අදාළත්වය පිළිබඳ තහවුරු කර ගැනීමට වෙනමම කටයුතු කළ යුතුය.

04. තම එකම පශ්චාත් උපාධිය විදේශ විශ්වවිද්‍යාලයකින් ලබා ගත් නිලධාරීන් හෝ හැදෑරූ පශ්චාත් උපාධි අතුරෙන් සේවා ව්‍යවස්ථාවට අදාළත්වයක් පවතින්නේ විදේශ විශ්වවිද්‍යාලයකින් හැදෑරූ පශ්චාත් උපාධියක පමණක් නම්, එම නිලධාරීන් තම පශ්චාත් උපාධි සනාථ කරගැනීමේ කටයුතු සඳහා ඉදිරිපත් කරන සහතිකපත්‍රවල සහතික කළ පිටපත්වලට අමතරව අදාළ විශ්වවිද්‍යාල පරිපාලනය අමතමින් සකස් කරන ලද ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. (එහි ආකෘතිය ඇමුණුම I පරිදි වේ.)

05. විදේශ විශ්වවිද්‍යාලවලින් ලබා ගත් පශ්චාත් උපාධි අදාළ විදේශ විශ්වවිද්‍යාල වෙත හෝ උසස් අධ්‍යාපන ආයතන වෙත යොමු කර සනාථ කරගත යුතු බැවින් ඒ සඳහා යම් මුදල් අයකිරීමක් සිදුවන්නේ නම් එම මුදල ගෙවිය යුතු ආකාරය පිළිබඳ අදාළ නිලධාරීන් ඉදිරියේදී දැනුවත් කෙරෙනු ඇත.

පී.ඩබ්ලිව්. රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකථන : 0112688124
ෆැක්ස් : 0112691690
විද්‍යුත් ලිපිනය : d.psd.pubad@gmail.com

**Annexure I**

**Sample Letter**

(Your Name)
(Address)
(Today's Date)

(Name of Recipient)
(Title)
(Address)

Dear Sir/Madam,

Verification of Authenticity of Foreign University Degree Certificate of Mr./Ms. …………….. from University of ………………………………………..

I do hereby authorize the High Commission of Sri Lanka in ……………………. through Foreign Ministry in Sri Lanka to obtain the verification of authenticity of my degree certificate received from the University of ……………………………. (with country)

Thank You.
…………………………………………
Mobile No.: ……………………………

Purpose: Please note that degree certificate is needed for (mention the purpose of getting degree verification)